මුළු ලෝකයේ කිතුණු ජනයාගෙන් විශ්වාසය අනුව අපහැමගේ මාතාව හැටියට අප පිළිගනු ලබන්නේ දේවමාතාවන්ය.අප සැමවිටම එතුමියට දක්වන්නේ ගෞරවයක් මිස වන්දනාවක් නොවේ.මන්දයත් අපගේ වන්දනාව හිමිවිය යුත්තේ මුළු ලෝ බලැති එකම දෙවියන්ට පමණි.එහෙත් මුළු ලෝවැසි කිතුණු ජනයා තුළින් එතුමියට දැක්වෙන්නේ මහත් ගෞරවාදරයකි.අප එතුමියට වන්දනා නොකරන්නේ දස පණත කඩවීම පාපයක් බැවිනි.නමුත් අද වෙනස් මත පිලිගත් දේව මව නොඅදහන පිරිසක්ද සිටිති.යෙහොවිවා,බයිබල් ආගම් එවැනි කොටසකි.ඔවුන් අදහන්නේ සැබෑ ආගමකි නොව තමාම තීරණය කරගත් නීති මාලාවකින් යුත් පුහු ආටෝපයක් ඇති ආගමකි.නමුත් ඉන් අපට පාඩුවක් නැත.අපගේ ඇදහිල්ල අපට වටී.අප විශ්වාස කළ යුත්තේ සැබෑ දේව වචනයයි.අපේ ඇදහීම රැවටීමක් නොවේ.දේව මාතාවන් සෑම විටම අප වෙනුවෙන් මැදහත් වන බව විශ්වාස කරන්න.ජම්මදෝෂයෙන් නිදොස්ව උපන් එකම නිර්මල කාන්තාව ඇයයි.ජීවිතයේ කොතෙකුත් දුක් කම්කටොලු මැද ආත්මානුභාවයෙන් ඒවා විඳදරාගෙන දෙවියන් වහන්සේගේ ඒකජනිත පුත් ක්‍රිස්තුන්වහන්සේගේ පිරිසිදු මාතාවන් වීමේ භාග්‍ය ඇය ලද්දාය.මංගලම් කීමේදී ඇය මුලින්ම බිය වුවත් "මම ස්වාමින්වහන්සේගේ දාසිය වෙමි ඔබ කීලෙස මට සිදුවේවායි"පවසා දේව අණට හිස නැමුවාය.ක්‍රිස්තු උපත සිදුවුයේද බෙත්ලෙහෙමේ ගවමඩුවකය.ඉන් පසු එහි හෙරෝද් රජු දවස ක්‍රිස්තුරජාණන් උපන් බව ශාස්ත්‍රයන්ගෙන් දැන උන්වහන්සේ මරාදැමීමට සෙවුහ.එවිට කන්‍යමරියාවන් සිය ස්වාමියා වු ජෝසප් සමග ඒ රැයෙහිම එනුවරින් පිටවි මිසරයට ගොස් හෙරොද් මියදෙන තෙක් එහි සිටියහ.මෙපමණක් නොව අවු 12 දී උන්වහන්සේ ජෙරුසලම් දේවමාලිගාවේදී නැතිවිය.නමුත් නැවත එතුමිය හැරි අවුත් එතුමා රැගෙන ගියාය.මෙපමණ ආදරෙන්,කරුණාවෙන්,යහගුණ කියාදී ඉතා වෙහෙස වී හැදු වැඩු දරුවා මුළු ලොවේ සැමදනන්ගේ පවුබැම් මුදවීමට ලොවට පුදකලාය.වෙන කිසිවක් නැතත් තමාගේ එකම පුත්‍රයා අපේ පාපවෙනුවෙන් කුරුසියට පුජාකිරිමේ ක්‍රියාවම ඇය අපහැමගේ අම්මා යැයි කීමට ප්‍රමාණවත් සාක්ෂියකි.වෙන කිසිම මවක් තම එකම පුත්‍රයා ලෝකය උදෙසා පුදයිද?නැත.එය කලහැක්කේ මුළු ලොවේ මිනිසුන් තම දරුවන් යැයි පිළිගත් එවැනි උතුම් කන්‍යාවකට පමණි.එපමණක් නොව එම සත්‍යය පිළිනොගන්නා අය වෙනුවෙන් ඇය සැබෑ ප්‍රාතිහාර්ය සිදුකර ඇත.ලුර්දුවේදී බර්නදෙත් තුමියට දර්ශනය වී ජපමාලය පිලිබඳව පැවසීය.ඉන්පසු පාතිමා නුවරදී ලුසි,ජසින්තා,ෆ්‍රැන්සිස් යන දරුවන්ට දර්ශනයවී ජපමාලය උච්ජාරණය කරණ ලෙස ඉල්ලා සිටියාය.නමුත් අනිවාර්යයෙන්ම පිළිගතයුතුම සත්‍යය නම් 1830 දී මරියතුමිය දර්ශනය වී ශු.කැතරින් තුමියට පුදුම පදක්කම ලබා දීමයි.තවමත් ශු.කැතරින් තුමියගේ නොදිරන සිරුර පැරිසියේ "රිව් ඩී බැක්"වල දේවස්ථානයේ තැන්පත් කර ඇත.ඔබට දැන්වුණත් එහිදි එය දැකගත හැක,මෙතරම් සාක්ෂි තිබුණත් එතුමිය නොපිළිගන්නා අය සිටිති නමුත් ඔවුන් යම් දිනක සත්‍යය වටහාගනු ඇත.අපි තවතවත් දේව මෑණියන්ට ලංවෙමු පුදුම පදක්කමේ වටිනාකම තේරුම්ගනිමු.දිනපතා ජපමාලය ඔප්පු කිරිමට පුරුදු වෙමු.

M. රොශිකා මැල්
031-2236147
9C
AMC